# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | දුරකථන අංකය Tel.NO | මගේ අංකය My NO | විද්‍යුත් ලිපිනය E-Mails |
| --- | --- | --- | --- |
| 2025.01.25 පැය 1350 | 011-2887973 | D/Media/Out / 142 /2025 | dir.media@police.gov.lk |


**වෙඩි තබා තුවාල සිදු කිරීමේ සිද්ධියකට සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්න සිදු කිරීම - අහුන්ගල්ල පොලිස් ස්ථානය.**

2025.01.09 වන දින අහුන්ගල්ල පොලිස් වසමේ අහුන්ගල්ල හන්දිය ආසන්නයේදී බෝගහපිටිය ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 51ක් වන කුලී ත්‍රීරෝද රථ රියදුරෙකුට යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් පිස්තෝල අවියකින් වෙඩි තබා තුවාල සිදු කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අහුන්ගල්ල පොලිස් ස්ථානය මඟින් විමශර්න ආරම්භ කර තිබුණි.

මෙම වෙඩි තැබීමට යොදා ගත් බවට සැකකරන **යතුරුපැදියක් අහුංගල්ල පොලිස් වසමේ පොල්අතුපලාන ප්‍රදේශයේ කුරුඳු ඉඩමක දමා ගොස් තිබියදී එදිනම නිලධාරීන් විසින් සොයා ගන්නා ලදී.** එම යතුරුපැදිය සම්බන්ධයෙන් සිදු කල විමශර්නයේදී 2024.09.24 වන දින අම්බලන්ගොඩ පොලිස් වසමේදී සොරකම් කරන ලද යතුරුපැදියක් බවට අනාවරණය වී ඇත.

මෙම අපරාධය සම්බන්ධයෙන් 2025.01.10. දින කරන්දෙනිය ප්‍රදේශයේදී වයස අවුරුදු 29 ක් වන පොල්අතුකන්ද ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු මේ වන විට රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

2025.01.20 වන දින අහුංගල්ල පොලිස් වසමේ වැලිවත්ත ප්‍රදේශයේදී අහුන්ගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හෙරොයින් මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු යතුරුපැදියක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 27 වයස් වල පසුවන ඌරගස්මන්හන්දිය හා කරන්දෙණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් 2025.01.21 වන දින බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රැඳවුම් නියෝග ලබා ගෙන සිදු කල වැඩිදුර විමශර්නයේදී ඉහත වයස අවුරුදු 27 ක් වූ කරන්දෙණිය ප්‍රදේශයේ පදිංචි සැකකරු 2025.01.09 වන දින අහුන්ගල්ල හන්දිය ආසන්නයේ වෙඩි තැබීම සිදු කිරීමට පැමිණි යතුරුපැදියේ පැදිකරු ලෙසද අනාවරණය වී ඇත.

අනෙක් සැකකරු වන වයස අවුරුදු 21 වූ ඌරගස්මන්හන්දිය ප්‍රදේශයේ පදිංචි අය මීට පෙර යුධ හමුදාවේ සේවය කර ඇති අයෙකු බවටත් මොහු සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සෘජු සම්බන්ධතා පවත්වන අයෙකු බවටත් අනාවරණය වී ඇත. ඒ අනුව සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ මෙහෙයවීම මත මෙම අපරාධය සිදු කර ඇති බව වැඩිදුර විමශර්නයේදී අනාවරණය වී ඇත.

සැකකරුවන් දෙදෙනා 2025.01.24 වන දින බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපිත් කිරීමෙන් පසු 2025.01.28 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**